Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තාක්ෂණවේදය සඳහා විද්‍යාව

සතිය- අගෝස්තු සිව්වන සතිය

ශ්‍රේණිය- 13

සැකසුම -එම් . ඒ . එස් .එන් මලවිආරච්චි සීවලී මධ්‍ය විද්‍යාලය

**11. තොරතුරු ලබා ගැනීම සහ සන්නිවේදනය සඳහා ඵලදායී ලෙස අන්තර්ජාලය භාවිත කරයි.**

_නිවැරැදි පිළිතුර තෝරන්න

**1. අන්තර් ජාලය පිළිබඳ ව අසත්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?**

1. එය කිසිවකුට අයත් නොවේ.
2. බිල්ගේට්ස්ට අයත් වේ.
3. එහි මධ්‍යගත පාලනයක් නැත.
4. එය පරිගණක ජාල වල ජාලයකි.
5. එයින් ලබා ගත හැකි තොරතුරු අතිශයින් නිවැරදි හෝ විශ්වාස දායක නොවේ.

**2. අන්තර් ජාලයට පිවිසීමේ සේවා සපයනු ලබන සමාගමක් හැඳින්වෙන්නේ කුමන නමකින් ද?**

1. Server 2. Client 3. WÄN 4. ISP 5. COM

**3. http://www.doenets.lk යනු කුමක් සඳහා නිදසුනක් ද?**

1. සේවා දායකයක් - සර්වර් (Server)
2. ඒකීය සම්පත් පිහිටුමක් (URL- uniform resource locator)
3. ජාලයක ප්‍රවේශ කේතයක් (an Access code of network)
4. ආයතනයක විද්‍යුත් තැපැල් ලිපිනය (an E-mail Address of an organization)
5. ප්‍රොක්සි සේවාවකි (Proxy Server)

**4. අන්තර් ජාලයට සම්බන්ධ පහත වගන්ති සලකා බලන්න.**

A. අන්තර් ජාලයට සම්බන්ධ වීම සඳහා සෑම යන්ත්‍රයකට ම IP නමින් හැඳින්වෙන අනන්‍ය ලිපිනයක් අවශ්‍ය වේ.
B. www යන්න විද්‍යුත් ලේඛන එකතුවකින් සමන්විත වේ.
C. අන්තර් ජාලය හරහා ප්‍රවේශ විය හැකි HTML ලේඛනයක් වෙබ් පිටුවක් ලෙස හැඳින් වේ.

ඉහත වගන්තිවලින් සත්‍ය වන්නේ

1. A පමණි
2. B පමණි
3. C පමණි
4. A හා B පමණි
5. A,B හා C යන සියල්ල සත්‍ය වේ

**5. පාසල් විද්‍යාගාරයක ඇති පරිගණක දෙකක් භාවිත කරමින් සිසුන් දෙදෙනෙකු එක ම වෙබ් අඩවියකට ප්‍රවේශ වේ. මෙම පරිගණක දෙකෙහි කුමක් වෙනස් ව පැවතිය යුතු ද?**

1. වෙබ් අතිරික්සුව (Web Browser)
2. ලිපින (IP Addresses)
3. අන්තර්ජාල සේවා සැපයුම්කරු (Internet Service Provider)
4. මෙහෙයුම් පද්ධතිය (Operting System)
5. සෙවුම් යන්ත්‍රය (Search Engine)